**කාර්මික සංවර්ධන මණ්ඩලය**

1. **මූල්‍ය ප්‍රකාශන**

----------------

1.1 **මතය**

------

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සහ මුදල් ප්‍රවාහ සත්‍ය සහ සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

--------------------------------------

1.2.1 **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත**

---------------------------------

පහත සඳහන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල නොවීම නිරීක්ෂණය විය.

| | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතය ( ශ්‍රී.ල.ගි.ප්‍ර.) | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී.ල.ගි.ප්‍ර.3 | ස්කන්ධය වෙනස් වීමේ ප්‍රකාශනය මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී.ල.ගි.ප්‍ර. 18 | වත්කම පැවති කාල පරිච්ඡේදය පදනම් කරගෙන ක්ෂයවීම් කළයුතු වුවද ආයතනයේ ක්ෂය ප්‍රතිපත්තිය ඊට පටහැනිව අනුගමනය කර තිබුණි. |

1.2.2 **ගණුම්කරණ අඩුපාඩු**

-----------------------

**අනුචිත හෙළිදරව් කිරීම**

---------------------------

i. සුනාමි ව්‍යසනයෙන් විපතට පත් ජනතාවට බෙදාදුන් රු.20,679,844 ක භාණ්ඩ වත්කමක් වශයෙන් විශේෂ ව්‍යාපෘති යටතේ දක්වා තිබුණි.

ii. දැනට භාවිතයේ නොපවත්නා ජීඑස්ටී බදු වශයෙන් ලැබියයුතු රු.1,424,654 ක් 2010 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා වල ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි.

### 1.2.3 නොසැසඳුන පාලන ගිණුම්

-----------------------------

පහත සඳහන් වෙනස්කම් නිරීක්ෂණය විය.

i. මූල්‍ය ප්‍රකාශන හා උපයෝගී ලේඛන සැසඳීමේදී අබලි විකුණුම් ආදායමේ රු.22,232,003 ක වෙනසක් ද අබලි ගැණුම් වියදමේ රු.27,476,261 ක වෙනසක් ද නිරීක්ෂණය විය.

ii. මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වාත්තු අංශය, පිළිමතලාව පිත්තල මධ්‍යස්ථානය සහ හා රබර් අංශයේ ඇති තොග, සත්‍යාපන වාර්තා සමඟ සැසඳීමේදී පහත දැක්වෙන පරිදි රු.75,832 ක් වැඩියෙන් ද රු.1,080,500 ක් අඩුවෙන්ද දක්වා තිබුණි.

| තොගය | මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය | තොග සත්‍යාපන වාර්තා අනුව ශේෂය | වැඩිවීම (අඩුවීම) |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| වාත්තු අංශය | 911,618 | 987,450 | 75,832 |
| පිළිමතලාව පිත්තල මධ්‍යස්ථානය | 655,193 | 57,245 | (597,948) |
| රබර් අංශය | 7,048,322 | 6,565,770 | (482,552) |

### 1.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

-----------------------------------

i. ලැබියයුතු වැට් බදු ලෙස ජංගම වත්කම් යටතේ රු.13,919,430 ක් දක්වා තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසානයේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට යවනු ලබන බදු වාර්තාවේ එය රු.230,740 ක් ලෙස දක්වා තිබුණි. වෙනස රු. 13,688,690 කි.

ii. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට යවන ලද බදු වාර්තාවට අනුව රඳවාගත් ප්‍රතිපූරණය කරගතහැකි වැට්බදු මුදල් රු.230,440 ක් වුවද මූල්‍ය වාර්තාවල ගෙවියයුතු වැට්බදු මුදල් වශයෙන් රු.346,482 ක් දකවා තිබුණි. වෙනස රු. 576,922 කි.

iii. මණ්ඩලයේ බැංකු ගිණුම් 5 ක රු.3,438,008 ක හඳුනා නොගත් ශේෂයන් විය.

### 1.2.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

--------------------------------------

(අ) ලැබිය යුතු ගිණුම්

--------------------

i. ණයගැති කාල විශ්ලේෂණය අනුව 2010 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු ගිණුම් 29 කට අදාලව වසර 1ට අඩු රු.20,340,568 ශේෂයක් ද වසර 1-2 අතර රු.13,147,138 ශේෂයක් ද, වසර 2-4 අතර රු.3,839,035 ශේෂයක් ද, වසර 4 ඉක්මවූ රු.19,839,102 ශේෂයක් ද ඇතුළුව එකතුව රු.57,165,843 ක් වූ අතර බොල් ණය ප්‍රතිපාදන ලෙස සලසා තිබුණේ රු.5,514,921 හෙවත් 10% ටත් අඩු ප්‍රමාණයකි.

ii. ඒකල,හොරණ,පල්ලෙකැලේ සහ පන්නල යනාදී කාර්මික ජනපදවල ණයගැතියන් වශයෙන් නොපවතින ශේෂයන් 84 කට අදාල රු.5,188,562 ක මුදලක් 2010 අවසන් ගිණුම්වල කාර්මික ජනපද ණයගැතියන් වශයෙන් දක්වා තිබුණි. ප්‍රමාණවත් බොල්ණය ප්‍රතිපාදන ද සලසා නොතිබුණි.

iii. සමාලෝචිත වර්ෂයේ හා ඊට පෙර වර්ෂවල ලබාගෙන තිබූ එකතුව රු.1,225,618 ක් වූ පුද්ගල අත්තිකාරම් පියවා නොතිබුණි.

**(ආ) ගෙවිය යුතු ගිණුම්**

----------------------

i. කාල විශ්ලේෂණය අනුව ගිණුම් 42 කට අදාලව 2010 දෙසැම්බර් 31 දිනට රු.91,768,653 ක් ගෙවිය යුතු වූ අතර වසර 3 ට වැඩි ණය හිමියන් රු.72,607,310 ක් විය.

ii. ජනපදවලින් ඉවත් වූ කර්මාන්තකරුවන් 201ගේ තැන්පතු රු.4,403,395 ක් නිරවුල් කර තිබියදී සාවද්‍ය ලෙස ඒවා සමාලෝචිත වර්ෂය අවසානයේ ණයහිමියන් යටතේ දක්වා තිබුණි.

iii. දැනට කාර්මික ජනපදවල "කුලී සින්නක්කර ගැණුම්" කර්මාන්තකරුවන් නොසිටියද එවැනි කර්මාන්තකරුවන් 114 කට ආපසු ගෙවියයුතු තැන්පතු රු.10,181,454 ක් සාවද්‍ය ලෙස 2010 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තාවල දක්වා තිබුණි.

iv. පුද්ගල අත්තිකාරම් ශේෂ 09 කට අදාල වටිනාකම වූ රු.49,306 ක් මූල්‍ය වාර්තාවල බැර ශේෂ වශයෙන් පැවතුණි.

v. වර්ෂ තුන ඉක්මවන ලද ආපසු ගෙවිය යුතු ටෙන්ඩර් තැන්පතු රු. 887,238 ක් පවතින අතර ටෙන්ඩර් කටයුතු අවසන් වූ පසු ඒවා නිරවුල් විය යුතු වුවත් එසේ කිරීමකින් තොරව ගිණුම්වල දක්වා තිබුණි.

### 1.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම

-------------------------------------

එක් එක් විෂයය ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොමැතිවීම හේතුකොට ගෙන පහත සඳහන් විෂයයන් සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ විගණනයේදී පිළිගැනීමට නොහැකි විය.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| -------- | ----------- | -------------------------- |
| | රු. | |
| (i) අවසන් තොගය - අබලි තොග | 8,295,784 | තොග සත්‍යාපන වාර්තා |
| (ii) පෙර ගෙවුම් | 37,125,654 | යාවත්කාලීනව පවත්වාගෙන යනු ලබන පෙර ගෙවුම් ලේඛන |
| (iii) ප්‍රත්‍යාගණන ලාභය | 16,697,397 | ප්‍රත්‍යාගණන විස්තර ඇතුලත් ජර්නල් වවුචර් සහ ජර්නල් සටහන් |

### 1.2.7 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකුල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකුල නොවීමේ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකුල නොවීම |
|---|---|---|
| | -------------------------------------- | ------------------- |
| (අ) | **රජයේ මුදල් රෙගුලාස**<br>-------------------------<br>(i) මු .රෙ.104, (ii) මු.රෙ 110, (iii) මු.රෙ 135, (iv)මු .රෙ.188 (2), (v) මු .රෙ.139(4) (vi) මු.රෙ.371 (ආ) (vii) 756 සහ 757 (viii) මුරෙ.770 (3) (ix) මු .රෙ.1645 (අ) (x) මු .රෙ. 1647 (ඉ) , මු .රෙ.802 හා මු.රෙ.11 කණ්ඩයේ vi උපලේඛනය (xi) මු .රෙ. 1653 | විධිවිධාන පරිදි කටයුතු කර නොමැත |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xiv පරිච්ඡේදයේ 4.1 උප ඡේදය | විධි විධානයන්ට පටහැනිව ක්ෂේත්‍ර රාජකාරීවල නිරතවන මාණ්ඩලික සේවකයන්ට සංයුක්ත දීමනාවට අමතරව ලැගුම් දීමනා ප්‍රතිපූර්ණය කිරීම වශයෙන් දිනකට රු.300 බැගින් සමාලෝචිත වර්ෂයේදී රු.322,655 ක් ගෙවා තිබුණි. |

(ඇ) චක්‍රලේඛ

----------

| | |
|---|---|
| (i) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 5.2.1 වගන්තිය | වාර්ෂික අයවැය ලේඛනය සමඟ අයවැයගත ශේෂපත්‍රය, ආදායම් ගිණුම හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) 2002 ඔක්තෝබර් 16 දිනැති අංක 9/2002 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | අතිකාල දීමනා සඳහා වෙන්කල මුදලින් 75 % ක් පමණක් වියදම් දැරීමට වගබලාගත යුතු වුවත් එම සීමාව ඉක්මවා රු.3,800,170 ක් දරා තිබුණි. |
| (iii) 2010 පෙබරවාරි 13 දිනැති අංක පීඊ/2010/04 දරන මැතිවරණ කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 03,04,09,10,11 ජේදයන් | නියමයන්ට පටහැනිව මණ්ඩලයේ වාහන 4 ක් මැතිවරණ කාලයේදී යොදාගෙන තිබීම. |
| (iv)1997 පෙබරවාරි 03 දිනැති අංක 06/97 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | තනතුරු 04 ක් සඳහා වර්ෂයකට වැඩි කාලයක සිට වැඩබලන තනතුරේ ආරම්භක වැටුපෙන් 1/4 දීමනාව ගෙවා තිබීම . |
| (v) 2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ පටිපාටිය සකස් කර අනුමත කරගෙන නොතිබුණි. |

## 2 මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

------------------------------------

### 2.1 මූල්‍ය සමාලෝචනය

---------------------

#### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

2010 වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා රජයේ දායකය රු.221,250,000 ක් වූ අතර වර්ෂය තුල මණ්ඩලයේ මෙහෙයුම් ප්‍රතිඵලය රජයේ දායකය ගණන් ගැනීමට පෙර රු.240,000,525 ක ඌනතාවයක් විය. ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ රජයේ දායකය වූ රු.222,000,000 ගණනය කිරීමට පෙර ඌනතාවය රු.231,194,712 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.8,805,813 ක පිරිහීමක් දක්නට ලැබුණ අතර බාහිර ආදායම් රු.මිලියන 10.5 ක අඩුවීම මෙම තත්වයට මූලික වශයෙන් බලපා තිබුණි.

## 2.2. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 2.2.1. කාර්ය සාධනය

-------------------

(අ) ඒකල කාර්මික ජනපදයේ ගොඩනැගිලි ඒකක 03 ක් හා සංවර්ධිත බිම් කොටස් 05 ක් අක්‍රිය කර්මාන්ත ව්‍යාපෘතීන් විය.

(ආ) කර්මාන්තකරුවන්ට අමුද්‍රව්‍ය ලබාගැනීමට අවශ්‍ය අරමුදල් සම්පාදනය සඳහා චක්‍රීය අරමුදලක් පිහිටුවීමේ අරමුණෙන් සෙස් අරමුදලින් රු. මිලියන 5 ක් නිදහස් කරණු ලැබුවද එකී මුදල් පැලියගොඩ රබර් නිෂ්පාදන සංවර්ධන අංශයට අමුද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා ලබාදී තිබුණි. ඒ හේතුකොටගෙන අපේක්ෂිත අරමුණු ඉටුවී නොතිබුණි.

(ඇ) ක්‍රියාකාර් සැලැස්ම සත්‍ය ප්‍රගතිය සමඟ සැසඳීමේදී 50% වඩා අඩුවෙන් ඉටු වූ අවස්ථා 28 ක් වූ අතර අංශයන් 9 කට අදාලව ඉටු නොවුනු වැඩසටහන් 17 ක් විය.

### 2.2.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

**(අ) ජංගම පුහුණු වැඩසටහන් පැවැත්වීම සඳහා බසරථයක් මිලදී ගැනීම**

------------------------------------------------------------------------

ගමින් ගමට තාක්ෂණය බෙදාහැර්මේ අරමුණින් 2009 වර්ෂයේ රු.8,712,000 ක් පමණ වැය කොට මිලදී ගත් බස් රථය 2010 වර්ෂයේ ගමන් වාර 08 ක් සඳහා කි.මී.3098 ක් පමණක් ධාවනය කර තිබුණි. ගමින් ගමට තාක්ෂණය බෙදාහැර්මේ ව්‍යාපෘතියේ අසාර්ථකත්වය මත රථය වැඩි කාලයක් ධාවනයෙන් තොරව පැවැතුන ද අළුත්වැඩියා කළ යුතු තත්ත්වයේ පැවතුණි.

**(ආ) පාවිච්චියට නොගත් බිල්පත් මුද්‍රණ යන්ත්‍රය**

---------------------------------------------

කටුබැද්ද ලක්කම් අලෙවි මධ්‍යස්ථානය සඳහා 2008 වර්ෂයේ මිලදී ගෙන තිබූ රු.306,750 ක් වටිනා බිල්පත් මුද්‍රණ යන්ත්‍රය පාවිච්චියට ගෙන නොතිබුණි.

**(ඇ) අත් සකපෝරු මිලදී ගැනීම හා බෙදා හැර්ම**

---------------------------------------------------

රු.906,450 ක් වටිනා අත් සකපෝරු 68 න් 56 ක් 2008 ජූනි 11 දින සැපයුම්කරුවන්ට නැවත සැකසීමට භාරදී තිබුණ අතර ඒවා සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නැවත ආයතනයට ලැබී නොතිබුණු අතර ඉතිර් පළුදු වූ සකපෝරු 12 නැවත සැකසීමට පියවර නොගෙන ගබඩාවේ රඳවා තිබුණි.

2.2.3 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

------------------------------

**අබලි ද්‍රව්‍ය ව්‍යාපෘතිය**

--------------------------

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබාදුන් අමාත්‍ය මණ්ඩල තීරණයට අනුකූලව අබලි මිලදී ගැනීම, විකිණීම සහ ගබඩා කිරීමට අදාලව රෙගුලාසි පද්ධතියක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි. මිලදී ගැනීමේදී , විකිණීමේදී හා ගබඩා කිරීමේදී නිරීක්ෂණය වූ අඩුපාඩු පහත දැක්වේ.

i. අබලි ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා 2007 වර්ෂයේ රේගු දෙපාර්තමේන්තුවට රු.4,591,122 ක් සහ හස්ත කර්මාන්ත මණ්ඩලයට රු.2,000,000 ක් අත්තිකාරම් ලෙස ගෙවා තිබුණු අතර 2008 වර්ෂයේදී රු.1,500,000 ක මුදලක් ලක්සල අලෙවි මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමට ලබා දී තිබුණ ද ඒවා සමාලෝචිත වර්ෂය අවසානය තෙක් නිරවුල් කරගෙන නොතිබුණි.

ii. සමාලෝචිත වර්ෂය වන විට පෙර ගෙවුම් ලෙස ආයතන 5 කට රු.2,811,759 ක මුදලක් ගෙවා වර්ෂයකට ආසන්න කාලයක් ගත වී තිබුණද අදාල භාණ්ඩ මණ්ඩලයට ගෙන ඒමට කටයුතු කර නොතිබුණි.

iii. අබලි මිලදී ගැනීම සඳහා පෙර ගෙවුම් කිරීමේදී ඇනවුමක් නිකුත් කිරීමකින් තොරව මුදල් ගෙවීම නිසා මිලදී ගන්නේ කුමන භාණ්ඩ කුමන ප්‍රමාණයෙන්ද යන්න නිශ්චය කළ නොහැකි විය.

iv. මණ්ඩලයට අදාල නොවන රු.775,263 පුවත්පත් දැන්වීම් අබලි ව්‍යාපෘතිය යටතේ වැයදරා තිබුණි.

v. අබලි ද්‍රව්‍ය මිලදී ගැනීම සඳහා එක් අත්තිකාරමක් ගෙවා ඊට සරිලන අබලි ද්‍රව්‍ය ලබා ගැනීමෙන් තොරව නැවත අත්තිකාරම් ලබා දී තිබුණි.

vi. කුඩා කර්මාන්ත කරුවන්ට සාධාරණ මිලකට අබලි ද්‍රව්‍ය බෙදාහල යුතු වුවද ඊට පටහැනිව ආයතන පහකින් මිලදී ගත් රු.24,097,624 වටිනා අබලි තොග විශාල කර්මාන්තකරුවන් 10 ක් අතරේ බෙදාහැර තිබුණි. තවද ඔවුන්ගෙන් ලැබිය යුතු මුදල් ලැබුණු බවට මුදල් අංශය නිකුත් කළ ලදුපත්වල පිටපත් විගණනයට ඉදිරිපත් නොවීය.

vii. අබලි ද්‍රව්‍ය ව්‍යාපෘතිය යටතේ මහා පරිමාණ ව්‍යාපාරිකයන් මෙන්ම ප්‍රවාහකයන්ද කුඩා පරිමාණ ව්‍යාපාරිකයන් සේ ලියා පදිංචි කරගෙන තිබුණි.

### 2.2.4 ආර්ථික නොවන ගනුදෙණු

---------------------------------

මණ්ඩලයේ අක්‍රීය බැංකු ගිණුම් 06 ක් පවතින අතර එම ගිණුම් තුල රු.80,854 ක ශේෂයක් හා රු.175 ක අයිරා ශේෂයක් විය.

### 2.2.5 නිශ්ක්‍රීය හා ඌන උපයෝජන වත්කම්

------------------------------------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) වටිනාකම තක්සේරු කර නොතිබුණු මහියංගන මියුනුගම ගොඩනැගිල්ල සහ පන්නල යෝග්‍ය තාක්ෂණ මධ්‍යස්ථානයේ නේවාසිකාගාරය, රු.1,412,000 ක් වූ බදුල්ල නිෂ්පාදන ප්‍රදර්ශනාගාරය හා අලෙවි මධ්‍යස්ථානය සහ රු. 4,131,520 ක් වූ කොටගල අධිකාර බංගලාව වසර 3 සිට 14 දක්වා වූ කාල පරාසයක් තුල භාවිතයට ගෙන නොතිබුණි.

(ආ) වටිනාකම රු. 1,180,000 ක් වූ බිම්මල් වියලන යන්ත්‍රය, රු. 298,500 ක් වූ Dough මිශ්‍රණ යන්ත්‍ර 03 ක් ද , රු.87,947 ක් වූ කුණරාගම ගම්මානයේ පන් හා තල්කොල භාණ්ඩ ද, රු.159,000 ක් වූ බිලිවර් වර්ගයේ ත්‍රීරෝද රථයක් ද,වටිනාකම සඳහන් නොවූ කාර් රථයක් ද වසර 2 සිට 11 දක්වා වූ කාල පරාසයක සිට භාවිතයට ගෙන නොතිබුණි.

### 2.2.6 හදුනා ගන්නා ලද පාඩු

--------------------------

(i) 2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛ අනුව නිසි වැටුප් පියවරයන් අදාල කර නොගැනීම නිසා සාවද්‍ය වැටුප් ගණනය කිරීමෙන් 2006 සිට 2010 කාලසීමාව තුල රු.6,268,931 ක් වැඩියෙන්ද රු.1,212,589 ක් අඩුවෙන් ද වැටුප් වශයෙන් ගෙවා තිබුණි.

(ii) නවබිම අබලි ගබඩාවේ තොග නැතිවීම් නිසා සිදුවී තිබූ රු.313,091 ක පාඩුව අදාල පාර්ශ්වයන් ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii) පොල්වත්ත මැටි ගම්මානයේ ප්‍රයෝජනය සඳහා ලබාදී තිබුණු රු. 260,400 ක් වටිනා අත් සකපෝරු 28 ක් පිරිවිතරයන්ට අනුකූල නොවූ බැවින් භාවිතයට ගත නොහැකිව තිබුණි.

(iv) හීනටියන කොහු ගම්මානයට ලබාදී තිබූ රු. 55,200 ක් වටිනා කොහ ලණු අඹරණ යන්ත්‍ර දෙකක් අස්ථාන ගත වී තිබුණි.

(v) බැංකු ගිණුම් 07 ක අයිරා ශේෂ පැවතීම සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේදී රු.44,658 ක අයිරා පොලී ගෙවා තිබුණි.

2.2.7 **කාර්ය මණ්ඩල පිරිවැය**

-----------------------------

පහත නිරීක්ෂණයන් කරණු ලැබේ.

i. සමාලෝචිත වර්ෂයේදී කොන්ත්‍රාත් හා අනියම් පදනම මත සේවකයන් 53 දෙනෙකු සේවයේ යොදවා තිබුණු අතර ඔවුන් සඳහා රු.12,316,092 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.

ii. අනුමත කාර්ය මණ්ඩලයේ ඇති තනතුරු සඳහා සේවකයින් 262 කු ගේ පුරප්පාඩු පවතින අතර එම පුරප්පාඩුවලට අදාල බඳවා ගැනීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

2.2.8 **සංයුක්ත සැලැස්ම**

--------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය පරිදි සංයුක්ත සැලැස්ම යාවත්කාලීන කර පවත්වා ගෙන යාමට කටයුතු කර නොතිබුණු අතර කාර්ය මණ්ඩල අවශ්‍යතාව, සංවිධාන සැලැස්ම, හා ශුදු අත විශ්ලේෂණ, එහි ඇතුලත් කර නොතිබුණි.

2.2.9 **විගණන හා කළමනාකරණ කමිටු**

---------------------------------------

2003 ජුනි 02 දින හා අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1වගන්තිය අනුව සෑම කාර්තුවකටම එක් වතාවක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවද 2010 වර්ෂය සඳහා රැස්වීම් පවත්වා නොතිබුණි.

3. **පද්ධති හා පාලන**

--------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතුයි.

(අ) බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීම
(ආ) අයවැය
(ඇ) ගිණුම්කරණය සහ පරිගණක පද්ධතිය
(ඈ) ණයගැති සහ ණයහිමි පාලනය
(ඉ) වාහන භාවිතය සහ ලේඛන නඩත්තුව
(ඊ) අබලි ද්‍රව්‍ය ගැණුම්,විකුණුම්
(උ) අත්තිකාරම්
(ඌ) තොග පාලනය